**ශීර්ෂය 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 226 - ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබූ නිර්දේශ ක්‍රියාත්මකකර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූලික ඇස්තමේන්තුගත ආදායම රු.25,500,000,000 ක් වූ අතර, සංශෝධිත ඇස්තමේන්තු ගත ආදායම රු.28,100,000,000 ක් විය. එය මූලික ආදායම් ඇස්තමේන්තුවට වඩා සියයට 10 ක් වුවත්, ඒසීඒ - 1(ii) හි මූලික ඇස්තමේන්තුව සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර විචලතා පැහැදිලි කිරීම් ප්‍රකාශයෙහි එම අගය සියයට 110 ක් ලෙස දක්වා තිබුණි. | වෙනස මූලික ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 10 ක් වුව ද, සංශෝධිත ඇස්තමේන්තු වෙනස වෙනුවට සංශෝධිත ඇස්තමේන්තු මුළු අගය යොදාගෙන ගණනය කිරීම හේතුවෙන් සියයට 110 ක් ලෙස සඳහන් කර ඇති බවත්, ඉදිරියේදී මෙවැනි ගණනය කිරීම් සඳහා වඩාත් අවධානය යොමුකර කටයුතු කරනු ලබන බව දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදිව ගණනය කිරීම් සිදු කර ගිණුම්වල දැක්විය යුතු වේ. |

(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුම් සැසඳුම් ප්‍රකාශය අනුව වර්ෂය අවසානයේ ලැබිය යුතු ශේෂය රු.131,422,838 ක් වුව ද, කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ මුළු | පිළිවෙලින් 2017,2018 හා 2019 වර්ෂවල අවසන් හර ශේෂය, කේවල ශේෂ ලැයිස්තුව හා සමාන නොවීම මත 2019.12.31 දිනට රු. | අදාළ වෙනසට හේතු අනාවරණය කරගෙන නිවැරදි කිරීමට ක්‍රියා කළ |

| | | |
|---|---|---|
| ශේෂය රු.130,983,010 ක් වූ බැවින්, රු.439,828 ක වෙනසක් නිරීක්ෂණය විය. 2019 වර්ෂයේ සිට වාර්තාවේ දිනය දක්වාම මෙම වෙනසට අදාළ හේතු සොයා එය නිවැරදිකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | 480,793 ක වෙනසක් ඇතිවී ඇති බවත්,එම වෙනසින් රු. 40,965ක මුදලක් නිවැරදිකර ඇති බවත්, තවදුරටත් වෙනස ලෙස පවතින රු.439,828 කින් ගිණුමට ගැළපුම් කළ හැකි රු.103,629 ක ණයශේෂ අනාවරණය කරගෙන ඇති බැවින්, ඉදිරියේදී එය නිවැරදි කිරීමට මෙන්ම අනෙකුත් හඳුනානොගත් ණයශේෂ අනාවරණය කරගැනීම සඳහා ප්‍රශ්නගත ගිණුම් නැවතත් පරීක්ෂාවන්ට ලක්කරන බවත් දක්වා තිබුණි. | යුතු වේ. |

**(ඈ) අග්‍රිම ශේෂය**

අග්‍රිම ශේෂය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට රු.10,851,787 ක් වූ අග්‍රිම ශේෂය භාණ්ඩාගාරයට පියවා තිබුණ ද, එදිනට වූ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ එම ශේෂය දක්වා තිබුණි. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සකස් කිරීමේදී වැරදීමකින් ජංගම වගකීම් යටතේ වර්ෂය අවසානයට භාණ්ඩාගාරයට නිරවුල් කළ රු.108,517,875 ක මුදල ඇතුළත්කර ඇති බවත්, ඒ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මුළු වත්කම් මුළු වගකීම්වලට සමාන වී නොමැති බවත් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස්කර, පරීක්ෂාකර ඉදිරිපත් කළ යුතු වේ. |

**(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ අනුකූල වාර්තාව අනුව දෙපාර්තමේන්තුවේ බැරකම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යන බව දක්වා තිබුණ ද, ගිණුමෙහි බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි වැය විෂයය අංක 226-1-1-1301 හි ඇතුළත් කර තිබූ රු.18,670,810 ක බැරකම් වටිනාකම බැරකම් ලේඛනයෙහි ඇතුළත්කර නොතිබුණි. | නිරීක්ෂණයේ සඳහන් වටිනාකම ගිණුමට ඇතුළත් කර තිබුණ ද, අතපසුවීමකින් බැරකම් ලේඛනයේ සටහන්කර නොමැති බව දක්වා තිබුණි. | බැරකම් ලේඛනයෙහි වර්ෂයට අදාළ බැරකම් වටිනාකම් සියල්ලම ඇතුළත්කර යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 7 වන ඡේදය ප්‍රකාරව ත්‍රෛයිමාසිකව ආදායම් වාර්තා එම කාලසීමාව අවසන් වූ දින සිට දින 15 ක් ඇතුළත ආදායම් ගණන්දීමේ නිලධාරින් විසින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත අඛණ්ඩව යොමුකළ යුතු වුව ද, 2023 පළමු කාර්තුවේ ආදායම් වාර්තා යවා තිබුණේ 2023 මැයි 26 දිනදී ය. | 2023 මාර්තු මස සිට ආදායම සෘජුවම මහා භාණ්ඩාගාර ගිණුම වෙත ප්‍රේෂණය කිරීම ආරම්භවීම හේතුවෙන් ආදායම් සැසඳීම් කටයුතුවල ඇති වූ ප්‍රමාද දෝෂය නිසා මෙම ත්‍රෛයිමාසික ආදායම් වාර්තාව භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ බව දක්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. |
| ආ) | දෙපාර්තමේන්තුවේ මූලික ආදායම් ඇස්තමේන්තුවට වඩා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සියයට 10කින් වැඩි වී තිබූ අතර,සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවට වඩා සත්‍ය ආදායම සියයට 52 කින් වැඩි වී තිබුණි. මේ අනුව ආදායම් පුරෝකථනය කිරීම නිසි අධ්‍යයනයකින් සිදුකර නොතිබුණි. | ඇස්තමේන්තුවක් සකස් කිරීමේදී පසුගිය මාස 6 ක ආදායම් ඉපයීම, ඉදිරි කාලපරිච්ඡේදය තුළ ඇති විය හැකි උච්ඡාවචනයන් පදනම් කරගත් බවත්, මු.රෙ.175(1) ප්‍රකාරව උපකල්පන සහ පුරෝකතන උපයෝගී කරගැනීමට සිදුවන අතර, 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තු සකස්කළද, ඇස්තමේන්තු කළ නොහැකි සාධක මත ඇස්තමේන්තුව හා සත්‍ය තත්ත්වය අතර හිතකර විචලනයක් ඇති විය හැකි බවත් දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුවට ලැබිය හැකි ආදායම් නිසි අධ්‍යනයකින් පුරෝකථනය කළ යුතු වේ. |

### 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) | සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 06 ක් සඳහා ප්‍රතිපාදිත රු.908,140,000 කින් රු.357,000,000 ක් මු.රෙ. 66 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරුකර තිබූ අතර, එය සියයට | 2023 වර්ෂය සඳහා වූ ඇස්තමේන්තු පිළියෙල කිරීම 2022 වර්ෂයේ තෙවන කාර්තුව තුළ සිදුකළ බැවින්, එම කාලපරිච්ඡේදය තුළ ජාතික ආර්ථිකයේ ඇති වී තිබූ ආර්ථික ක්‍රියාකාරකම්වල හැකිලීම්, විදේශ | වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසි අධ්‍යනයකින් සිදුකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | 30 ත් සියයට 300 ත් අතර ප්‍රමාණයක් ගෙන තිබුණි. ඒ අනුව වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසි අධ්‍යනයකින් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. | විනිමය ගැටලු හා අසාමාන්‍ය ලෙස වෙළඳපොළ මිල ඉහළ යාම හේතුවෙන් ආදායම් හා වියදම් පුරෝකථනයන් තාත්විකව සිදු කිරීමට අසීරු බව දක්වා තිබුණි. | |
| ආ) | පුනරාවර්තන වැය විෂයයන් 08 ක් වෙනුවෙන් ප්‍රතිපාදිත රු.768,850,000 ක ප්‍රතිපාදනයෙන් රු.372,479,363 ක් ඉතිරි වී තිබූ අතර, එම ඉතිරිය සියයට 30 සිට සියයට 63 දක්වා පරාසයක්ගෙන තිබුණි. | 2023 වර්ෂය සඳහා වූ ඇස්තමේන්තු පිළියෙල කිරීම 2022 වර්ෂයේ තෙවන කාර්තුව තුළ සිදුකළ බැවින් එම කාලපරිච්ඡේදය තුළ ජාතික ආර්ථිකයේ ඇති වී තිබූ ආර්ථික ක්‍රියාකාරකම්වල හැකිලීම්, විදේශ විනිමය ගැටලු හා අසාමාන්‍ය ලෙස වෙළඳපොළ මිල ඉහළ යාම හේතුවෙන් ආදායම් හා වියදම් පුරෝකථනයන් තාත්විකව සිදු කිරීමට අසීරු බව දක්වා තිබුණි. | වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසි අධ්‍යනයකින් සිදුකළ යුතු වේ. |
| ඇ) | ප්‍රාග්ධන වැය විෂයයන් 2 ක් වෙනුවෙන් ප්‍රතිපාදිත රු.111,500,000 ක ප්‍රතිපාදනයෙන් රු.26,796,273 ක් ඉතිරිව තිබූ අතර, එම ඉතිරිය සියයට 22 සිට සියයට 36 දක්වා පරාසයක්ගෙන තිබුණි. | 2023 වර්ෂය සඳහා වූ ඇස්තමේන්තු පිළියෙල කිරීම 2022 වර්ෂයේ තෙවන කාර්තුව තුළ සිදුකළ බැවින් එම කාලපරිච්ඡේදය තුළ ජාතික ආර්ථිකයේ ඇති වී තිබූ ආර්ථික ක්‍රියාකාරකම්වල හැකිලීම්, විදේශ විනිමය ගැටලු හා අසාමාන්‍ය ලෙස වෙළඳපොළ මිල ඉහළ යාම හේතුවෙන් ආදායම් හා වියදම් පුරෝකථනයන් තාත්විකව සිදු කිරීමට අසීරු බව දක්වා තිබුණි. | වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසි අධ්‍යනයකින් සිදුකළ යුතු වේ. |
| ඈ) | වැය විෂයය අංක 1-1-0-1003 හි රු.126,535ක්ද වැය විෂයය අංක 1-1-0-2502(99) හි රු.260,633 ක් ද ඉතිරිව තිබියදී මු.රෙ.66 යටතේ පිළිවෙලින් රු.2,800,000 ක් සහ රු.2,000,000 ක් මාරු කරගෙන තිබුණ ද, වැය විෂයයන් දෙකෙහි ම ඉතිරිය සහ මු.රෙ. 66 යටතේ මාරු කරගෙන තිබූ රු.4,800,000 ක මුදලක් වර්ෂ අවසානයේ දී ඉතිරිව පැවතුණි. | 2023 වර්ෂය තුළ මාර්ගගත ක්‍රමවේදයට ගමන්බලපත් නිකුත් කිරීම සඳහා ඇඟිලි සලකුණු ලබාගැනීමට විවෘත කළ ප්‍රාදේශීය කාර්යාල පනහ (50) තුළ කාර්ය මණ්ඩල වෙනුවෙන් දිරිදීමනා සඳහා වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන් උපයෝජනය වී නොතිබීම මෙන් ම අපේක්ෂිත වැය දැරීමට සිදු නොවීම හේතුවෙන් 1003 වැය විෂයයේ සහ 2509 (99) වැය විෂයයේ දක්වා තිබූ ඉතිරිය සිදු වී ඇති බව දක්වා තිබුණි. | වියදම් දරා නොමැතිව වැය විෂයයන්වල ප්‍රතිපාදන ඉතිරිව තිබියදී මු.රෙ 66 යටතේ ද තවදුරටත් ප්‍රතිපාදන මාරු කරගෙන මුදල් අවුරා තබා නොගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| ඉ) | පුනරාවර්තන වැය විෂයයන් 02 ක මූලික වියදම් ඇස්තමේන්තුව වූ රු.86,300,000 ක මුදල රු.195,300,000 ක් දක්වා සියයට 122 සිට සියයට 300 දක්වා ද,ප්‍රාග්ධන වැය විෂයයන් දෙකක මූලික වියදම් ඇස්තමේන්තුව වූ රු.1,354,000,000 ක මුදල රු.2,347,100,000 ක් දක්වා සියයට 73 සිට සියයට 78 දක්වා ද පරාසයකින් සංශෝධනය වී තිබුණි. | ඉල්ලුම් කරන ලද අයවැය ප්‍රතිපාදන නොලැබීම, සමාලෝචිත වර්ෂය තුළ සේවා සැපයුම් ආයතන මාසිකව අයකරන ලද සේවා ගාස්තු (විදුලිය,ජලය වැනි) ඉහළ නැංවීම මෙන්ම දෙපාර්තමේන්තුමය සේවාවන්ට ඇති වූ ඉහළ ඉල්ලුම හේතුවෙන් (ගමන් බලපත්,මගී නිෂ්කාශන කටයුතු වැනි) වියදම්වල සිදුවූ වැඩිවීම මත නිරීක්ෂණයේ සඳහන් පරිදි ඉහළ ප්‍රතිශතයකින් ප්‍රතිපාදන මාරු කරගැනීමට සිදු වී ඇති බව දක්වා තිබුණි. | වැය විෂයයන්ට අවශ්‍ය වියදම් නිසි ලෙස පුරෝකථනයකර අවශ්‍යතාවයන්ට සරිලන පරිදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අප්‍රේල් 27 දිනැති හා අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ (04) ඡේදය ප්‍රකාරව බැඳීම් හා බැරකම් පිළිබඳ තොරතුරු සිගාස් වෙබ් අඩවියට උඩුගත කළයුතු වුව ද, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බැඳීම් හා බැරකම් පිළිබඳව එසේ වාර්තා කර නොතිබුණි. | 2023 වර්ෂයේ මාර්තු මස සිට වියදම් සඳහා අවශ්‍ය අක්මුදල් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා බැවින්, බැරකම් වාර්තා කිරීමට මාර්ගගත ක්‍රමයට ITMIS පරිගණක මෘදුකාංගය හඳුන්වාදී තිබූ පහසුකම භාවිතාකර තිබුණි. ඊට සමගාමීව සෑම ගනුදෙනුවක් සඳහාම බැඳීම් හා බැරකම් ඇති කරනු ලබන අවස්ථාවේ CIGAS වැඩසටහනට ඇතුළත් කිරීමට හැකි ලෙස ක්‍රමවේදයක් සකසාගැනීම සඳහා කටයුතු කරන බව දක්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.4 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහකර දැක්වේ.

| | නිරීක්ෂණය | | | | |
|---|---|---|---|---|---|
| | **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| i | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | මුදල් රෙගුලාසි ප්‍රකාරව පොදු 71 ආකෘතිපත්‍රයක පිළියෙල කළ මාසික තැන්පතු | මු.රෙ.565(5) අනුව මාසික තැන්පත් සැසඳුම් ප්‍රකාශයේ සාරාංශයක් ඉදිරියට යොමු කිරීමට විෂයය | යොමුගත මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | සංග්‍රහය 565(5) | සාරාංශ ප්‍රකාශයක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතුකර නොතිබුණි. | නිලධාරියා දැනුවත්කර ඇති බව දක්වා තිබුණි. | |
| | 750(1) | මුදල් රෙගුලාසි ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතුව පවතින සංචිත හා වෙන් කළ වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | මෙම දෙපාර්තමේන්තුව සතු සියලුම වාහන ආගාමික හා විගාමික නීති උල්ලංගනය කරන විදේශිකයින් අත්අඩංගුවට ගැනීම සහ විමර්ශන කටයුතු සඳහා අවස්ථානුකූලව යොදවන බැවින් මෙම වාහනවල රාජ්‍ය ලාංඡනය මුද්‍රා කිරීම මඟින් විමර්ශන කටයුතු සඳහා ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වන බවත්, දෙපාර්තමේන්තු නම සහිත බෝඩ් ඉදිරියට පෙනෙන ආකාරයෙන් රථයේ ඉදිරිපස වීදුරුව ඇතුළතින් තබා ඇති බවත් දක්වා තිබුණි. | යොමුගත මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු වේ. |
| ii. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br><br>2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛයේ (05) ඡේදය | චක්‍රලේඛ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙලකර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව නියමිත ආකෘතිය පදනම්කර ගනිමින් මීළඟ වර්ෂයේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කරමින් පවතින බව දක්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛයප්‍රකාරව මානව සම්පත් සැලැස්ම පිළියෙල කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | 2016 දෙසැම්බර් 22 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ (3.1) ඡේදය | චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු වාහන 02 හැර ඉතිරි වාහනවල 2013 වර්ෂයෙන් පසුව ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | ඉන්ධන පරීක්ෂාවන් සිදු කිරීම සඳහා වන පරීක්ෂණ කමිටුව මේ වන විට පත්කිරීම සිදුකර ඇති බවත්, සංචිත වාහන රාජකාරී කටයුතුවලට බාධා නොවන ආකාරයෙන් ඉදිරියේදී ඉන්ධන පරීක්ෂාව සඳහා යොමු කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු වාහනවල ඉන්ධන පරීක්ෂාවන් සිදුකළ යුතු වේ. |
| iii. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ<br><br>2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන චක්‍රලේඛයේ 12(අ)ඡේදය | චක්‍රලේඛ ප්‍රකාරව දැනට සේවයේ සිටින කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගතකර නොතිබුණි | දැනට සේවයේ සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර 2023 සහ 2024 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කොට ඇති බවත්, එය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අනුමත කොට ඇති බවත් දක්වා තිබුණි. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අදාළ ප්‍රගති වාර්තාව අනුව ලැප්ටොප් පරිගණක 50 ක් මිලදී ගැනීමට සැලසුම්කර තිබුණ ද, එහි මූල්‍ය ප්‍රගතිය සියයට 0 ක් වූ අතර, භෞතික ප්‍රගතිය සියයට 45 ක් විය. ඒ අනුව අදාළ කාර්ය සැලසුම් කළ පරිදි ඉටුකර නොතිබුණි. | ප්‍රතිචාර දක්වන ලද ලංසුකරු නියමිත කාලයේදී භාණ්ඩ ලබාදීමට කටයුතු නොකිරීම නිසා අදාළ ප්‍රසම්පාදනය සැලසුම්කළ කාලය තුළ ඉටු නොවූ අතර, 2024 ක්‍රියාකාරී සැලැස්ම යටතේ මේ සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතින බව දක්වා තිබුණි. | සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටුකළ යුතු වේ. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබානොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශ |
| --- | --- | --- |
| තොරතුරු තාක්ෂණ අංශයෙන් ලබාගත් වාර්තාව අනුව මාර්ගගත ක්‍රමය ඔස්සේ කඩිනම් සේවාව සහ සාමාන්‍ය සේවාව යටතේ ලැබී තිබූ ගමන් බලපත්‍ර අයදුම්පත් 113,916 ක් අතරින් ගමන්බලපත්‍ර 48,770 ක් එනම් සියයට 43 ක් පමණක් වර්ෂය තුළ නිකුත්කර තිබුණු අතර, විවිධ දෝෂ සහිත ගමන්බලපත්‍ර 65,146 ක් නිකුත් කළ යුතුව පැවතුණි.<br><br>ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පවතින අඩුපාඩු හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී තිබූ අතර, මෙම දෝෂ නිවැරදිකර විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමට විදේශ ගමන්බලපත්‍ර ඉල්ලුම්කරුවන්ට මෙන්ම දෙපාර්තමේන්තුවට ද අමතර කාලයක් හා පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. | ගමන් බලපත්‍ර නිකුත් කිරීමට අදාළව පවතින දුෂ්කරතා මඟ හරවා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත් පිළිබඳ පොදු උපදෙස් මාලාවක් සකස්කර ලබාදීමට අවශ්‍ය කටයුතු ගමන් බලපත් අංශය සිදු කරන බවත්, මාර්ගගත ගමන් බලපත්‍ර නිකුත් කිරීමට යොදවා ඇති නිලධාරීන්හට අවශ්‍ය වන පුහුණුව මේ වන විටත් ලබාදී ඇති බවත් දක්වා තිබුණි. | ලැබී ඇති ගමන් බලපත්‍ර අයදුම්පත් සඳහා කඩිනමින් ගමන්බලපත් නිකුත් කිරීමට ක්‍රියා කළ යුතු වේ. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශ |
| --- | --- | --- | --- |
| අ) | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව, දෙපාර්තමේන්තුවට අයත් මත්තල,පලාලි,රත්මලාන සහ කටුනායක ගුවන්තොටුපල කාර්යාල හා විවේකාගාර, ත්‍රිකුණාමලය,කොළඹ සහ ගාල්ල වරාය කාර්යාල හා විවේකාගාර තුළ පිහිටි පරිගණක වැනි යන්ත්‍ර නඩත්තු සඳහා වූ පුද්ගලික ආයතන විසින් අවිධිමත් ලෙස එම උපකරණ මාරු කිරීම,අලුත්වැඩියාවන් සඳහා ගෙන යාම වැනි කාර්යයන් සිදු කරන බවත්, කාර්යාලයේ ඇති අනෙකුත් භාණ්ඩ දෙපාර්තමේන්තුවේ වෙනත් | එක් අංශයකින් වෙනත් අංශයකට භාණ්ඩ රැගෙන යාමේදී විධිමත් පරිදි නිකුත් හා ලැබීම් නියෝග භාවිතාකර කටයුතු කරන ලෙසටත්, අලුත්වැඩියා සඳහා රැගෙන යාමේදී විධිමත් පරිදි කටයුතු කරන ලෙසටත් දැනුවත්කර ඇති බව දක්වා තිබුණි. | අදාළ භාණ්ඩ අලුත්වැඩියා සඳහා රැගෙන යාම උපකරණ මාරු කිරීම විධිමත් අනුමැතියක් මත සිදුකළ යුතු අතර, කාර්යාලයේ ඇති උපකරණ රැගෙන යාමේදී භාණ්ඩ නිකුත් කිරීමේ හා ලැබීම් නියෝග භාවිතා කරමින් විධිමත් ක්‍රමවේදයකට අනුව සිදුකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | කාර්යාලයකට හෝ ප්‍රධාන කාර්යාලය වෙත රැගෙන යාමේදී හෝ අලුත්වැඩියාවන් සඳහා ගෙන යාමේදී විධිමත් ලියවිල්ලක් මගින් එය සිදු නොකරන බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | 2022 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව දික්ඕවිට වරාය කාර්යාල සඳහා 2021 අප්‍රේල් 06 දින ප්‍රින්ටරයක් ලබාදී තිබුණ ද, තොග ලේඛන වල සටහන් කර නොතිබූ අතර, එය භාවිතයට නොගෙන ඇසුරුම් පිටම තොටුපල අංශයේ තබා තිබූ අතර, 2020 අගෝස්තු 11 දින ලබාදුන් All in one පරිගණක 03 ක් ද වසර 03 ක් පුරා භාවිතයට නොගෙන ඇසුරුම් පිටම තිබූ අතර එහි වගකීම් කාලය ද අවසන් වී තිබුණි. | දික්ඕවිට කාර්යාලය වෙත නිකුත් කිරීමේ නියෝග A/32 205352 හා A/32 205351 යටතේ ලබාදී තිබූ Lexmark ප්‍රින්ටරය හා All in one පරිගණක 03 මේ වන විට විධිමත් පරිදි කොළඹ වරාය කාර්යාලයේ භාවිතය සඳහා යොදවා ඇති බව දක්වා තිබුණි. | භාණ්ඩ ලබාදීමේදී හා ලබා ගැනීමේදී තොග ලේඛනවල සටහන් කළ යුතු අතර, එම භාණ්ඩ සඳහා නිකුත් කිරීමේ හා ලැබීමේ නියෝග භාවිතා කරමින් විධිමත් පරිදි කටයුතු කළ යුතු වන අතර, කාර්යාලයේ අවශ්‍යතාවය මත භාණ්ඩ ලබාගත යුතු අතර, ලබාගත් භාණ්ඩ නිෂ්ක්‍රියව තබා නොගත යුතු වේ. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශ** |
|---|---|---|---|
| අ) | 2023 දෙසැම්බර් 31 දිනට මියගිය නිලධාරියෙකුගේ ආපදා ණය ලෙස රු.54,757 ක් වසර 05 කට වැඩි කාලයක සිට ද, විශ්‍රාම ගිය නිලධාරිනියකගේ ආපදා ණය ලෙස රු.150,683 ක් වසරකට වැඩි කාලයක සිට ද වැඩ තහනම් කළ නිලධාරීන් 02 දෙනෙකුගෙන් ආපදා ණය ලෙස රු.252,124 ක් අවුරුදු 02 සිට අවුරුදු 10 දක්වා කාලයක සිට ද අයවිය යුතුව පැවතුණි. | මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණයශේෂය පොත්වලින් කපාහැරීම සඳහා අවසර ලබාගැනීමට ද විශ්‍රාම ගිය නිලධාරිනිය දැනුවත්කර ණයශේෂය අයකර ගැනීමටත්, විනය නියෝගය අනුව අනිවාර්ය විශ්‍රාම ගන්වා ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය විශ්‍රාම වැටුප් සකස් කිරීමේදී අයකර ගැනීමටත්, වැඩ තහනම්කර ඇති නිලධාරියෙකුගේ ණය අයකර ගැනීම සඳහා නීතිමය උපදෙස් ලබාගැනීමට නීතිපති දෙපාර්තමේන්තුවට ද භාරදී ඇත. | අදාළ ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගගත යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| ආ) | 2016 අගෝස්තු 29 වන දින සිට මේ දක්වා බත්තරමුල්ල සුහුරුපාය ගොඩනැගිල්ලේ පළමු මහලේ සිට හත්වන මහල දක්වා සහ පියස පරිශ්‍රයේ කොටසක ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය කුලී පදනම මත ස්ථාපිතකර ඇති අතර, 2016 සිට මේ දක්වා එකතුව රු.2,307,736,815 ක් ආරක්ෂක අමාත්‍යාංශයට කුලී හා නඩත්තු වියදම් ලෙස ගෙවා ඇති නමුත්,මේ දක්වා ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ නොතිබුණි. | අංක අමප/17/0171/703/014-1 හා 2017.04.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මූල්‍ය අංශය මඟින් ගොඩනැගිලි කුලී මුදල් ආරක්ෂක අමාත්‍යාංශය වෙත වැයශීර්ෂ හරහා ගෙවීම් කර ඇති බවත්, ආරක්ෂක අමාත්‍යාංශයේ අංක: MOD/TEC/8/SPI/2018(185) දරන 2018.04.18 දිනැති හා අංක MOD/TEC/8/SPI/2021(16) දරන 2021.01.18 දිනැති “සුහුරුපාය ගොඩනැගිල්ලෙහි බිම් කුලිය සඳහා මුදල් අයකිරීම” මැයෙන් නිකුත් කරන ලද ලිපි මඟින් මාසිකව ගෙවිය යුතු මුදල පිළිබඳව දැනුම්දී ඇති බවත් දන්වා ඇත. | කුලී පදනම මත ගොඩනැගිලි ලබාගැනීම සම්බන්ධව විධිමත් ගිවිසුමකට එළඹිය යුතු වේ. |
| ඇ) | බත්තරමුල්ල සුහුරුපාය ගොඩනැගිල්ලේ පළමු මහලේ බැංකු 04 ක් සඳහා ගනුදෙනු කිරීමට ඉඩ පහසුකම් වෙන්කරදී තිබුණ ද, එම ආයතනවලින් කුලී හෝ වෙනත් ගාස්තුවක් අයකරගෙන නොතිබුණි. | ජාතික ආරක්ෂාව පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය මත මෙම බැංකු උපකාර්යාල පිහිටුවා ඇති බවත්,දෙපාර්තමේන්තු අවශ්‍යතාවය මත ඇති කළ එම කාර්යාල සඳහා ඉතා සුළු ඉඩ ප්‍රමාණයන් යොදාගෙන ඇති බැවින් බදු කුලී,ජල හෝ විදුලිය සඳහා ගාස්තු අය කිරීම සිදු නොවන බවත්, මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ උපදෙස් විමසීමට කටයුතු කරමින් පවතින බවත් දක්වා තිබුණි. | විධිමත් වූ ක්‍රමවේදයක් යටතේ ගාස්තු අයකර ගැනීමට ක්‍රියාමාර්ගගත යුතු වේ. |
| ඈ) | ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ දීරිදීමනා ක්‍රමය සංශෝධනය කරමින් 2012 සැප්තැම්බර් 05 දින රාජ්‍ය පාරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් EST– 8/ALLOW/04/125/02 අංක යටතේ රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් නිකුත්කර තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| | i. ඉහත ලිපිය අනුව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නිලධාරින් සඳහා වූ දිරිදීමනා ගෙවීමේ ක්‍රමයට භාණ්ඩාගාරයේ එකඟතාවය ලබාගත යුතු වුව ද, එම එකඟතාවය ලබාගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක: EST–8/ALLOW/04/125/02දරන හා 2012.09.05 දිනැති ලිපියට මහා භාණ්ඩාගාරය විසින් අනුමැතිය නොමැතිව නිකුත්කර ඇති බව දක්වා ඇතත්, ඊට මහා භාණ්ඩාගාරයේ මෙන්ම ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ද ලැබී ඇති බවත් දන්වා තිබුණි. | මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලද ලිපිවල පිටපත් විගණනයට ලබාදිය යුතු වේ. |
| | ii. සංශෝධිත දිරිදීමනා ක්‍රමයේ කොන්දේසි ඇතුළත් කරමින් ගෙවීම් ක්‍රමවේදය පිළිබඳ උපදෙස් ඇතුළත්කර දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් චක්‍රලේඛයක් නිකුත් කළ යුතු වුව ද, එවැනි උපදෙස් අඩංගු චක්‍රලේඛයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | දිරිදීමනා ක්‍රමයට ලබාදී ඇති අනුමැතින් සහ එම අනුමැතීන්හි අඩංගු කොන්දේසි සහ දිරිදීමනා ක්‍රමවේදය පිළිබඳව උපදෙස් ඇතුළත් කරමින් චක්‍රලේඛයක් ඉදිරියේදී නිකුත් කිරීමට කටයුතු කරමින් පවතින බව දක්වා තිබුණි. | සංශෝධිත දිරිදීමනා ක්‍රමයේ කොන්දේසි සහ උපදෙස් ඇතුළත් කරමින් ගෙවීම් ක්‍රමවේදය පිළිබඳ චක්‍රලේඛයක් නිකුත් කළ යුතු වේ. |
| | iii. දීමනා ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු වුව ද,ඒ අනුව කටයුතු සිදුකර නොතිබුණි. දිරිදීමනා ලබාගැනීමට ඉලක්කගත සීමාවන් හඳුන්වාදී තිබුණ ද, දිරිදීමනා ගණනය කිරිමේදී ඒ පිළිබඳ අවධානය යොමු කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේ වුව ද 2023 වර්ෂය තුළ දිරිදීමනා වශයෙන් රු.208,792,974 ක් ගෙවීම්කර තිබුණි. | ඉලක්කගත සීමාවන් සම්බන්ධයෙන් අදාළ අංශයන්ට අනුමත සියයට 50 ක දිරිදීමනාවෙන් සියයට 20 හෝ සියයට 30 ක් නිලධාරීන් වෙත කෙලින්ම ගෙවනු ලබන බවත්, ඉතිරි සියයට ගණන නිලධාරීන් තනි තනි වශයෙන් නොව අංශයක් වශයෙන් උපයා ගැනීම සැලකිල්ලට ගෙන ඇති බවත් සඳහන්කර ඇත. | දිරිදීමනා ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර, දිරිදීමනා ගණනය කිරීමේදී හා ගෙවීම් කිරීමේදී හඳුන්වාදී ඇති ඉලක්කගත සීමාවන් පිළිබඳ අවධානය යොමුකළ යුතු වේ. |
| ඉ) | 2017 දෙසැම්බර් 22 දින CCTV කැමරා මිලදී ගැනීමට රු.1,330,550 ක් සහ සවි කිරීම වෙනුවෙන් රු.829,903 ක් වශයෙන් එකතුව රු.2,160,453 ක මුදලක් වැයකර කැමරා 62 ක් මිලදී ගෙන තිබුණ ද, එම කැමරා සවි කිරීමට ක්‍රියා නොකර වසර 06 කට වැඩි කාලයක් ගබඩාව තුළ නිෂ්ක්‍රීයව පැවතුණි. | මෙම වර්ෂයේදී ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා CCTV පද්ධති සවි කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර ඇති බැවින් මෙම වර්ෂය තුළදී සවිකර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරමින් පවතින බව දක්වා තිබුණි | මිලදී ගෙන ගබඩාකර ඇති CCTV කැමරා නිෂ්ක්‍රීයව තබා නොගෙන අදාළ ස්ථානවල සවිකිරීමට ක්‍රියා කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| ඊ) | දෙපාර්තමේන්තුව විසින් හිස් විදේශ ගමන් බලපත්‍ර ලබාගැනීමට 2003 වර්ෂයේ තෝරාගෙන තිබූ පුද්ගලික ආයතනයෙන් අවුරුදු 21 ක පමණ කාලයක්ම ටෙන්ඩර් කැඳවීමකින් තොරව සැපයුම් දිගු ලබාදෙමින් ප්‍රසම්පාදන කාර්යයෙන් බැහැරව හිස් විදේශ ගමන් බලපත්‍ර මිලදී ගෙන තිබුණි. හිස් ගමන්බ ලපත්‍රවල අවශ්‍යතා සැලකිල්ලට නොගෙන මෙම මිලදී ගැනීම සිදු කිරීම හේතුවෙන් නිකුත් කිරීමට අවශ්‍ය ගමන් බලපත්‍ර සංඛ්‍යාව අවශ්‍යතාවයට ගැළපෙන මට්ටමින් නොවීම ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදයට මූලික හේතුවක් වී තිබුණි. | අංක: 23/1271/626/008-1 හා 2023.07.17 දිනැති කැබිනට් මණ්ඩල අනුමැතිය අනුව පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරා ගන්නා ලද ලංසුකරු වෙත ඉලෙක්ට්‍රොනික විදේශ ගමන්බලපත්‍ර ලබාගැනීමේ ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමට 2024.04.08 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇති බව දක්වා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව ටෙන්ඩර් කැඳවීම් කර ආයතනයේ අවශ්‍යතාවයට ගැළපෙන පරිදි හිස් ගමන් බලපත්‍ර මිලදී ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| උ) | දෙපාර්තමේන්තුව විසින් හිස් ගමන් බලපත්‍ර නියමිත කාලවකවානුව තුළ ගෙන්වා නොගැනීම නිසා ඇති වූ හිස් ගමන් බලපත්‍ර හිඟය නිසාවෙන්,ගමන් බලපත්‍ර ගුවන් මඟින් ගෙන්වීමට ගුවන් භාණ්ඩ ප්‍රවාහනය,ලේඛන සහ අමතර වැඩ ගාස්තු ලෙස USD 33,672 ක මුදලක් පුද්ගලික ආයතනයක් වෙත ද, නැව් වන්දි ගාස්තු ලෙස රු.322,952 ක මුදලක් ලංකා බැංකුව වෙත ද, දේශීය නැව් නියෝජිත ලේඛන ගාස්තු නැවත ගෙවීම ලෙස රු.58,652 ක මුදලක් සැපයුම්කරු වෙත ද ගෙවීමට සිදුවීම නිසා දෙපාර්තමේන්තුවට රු.13,184,416 ක අතිරේක වියදමක් දැරීමට සිදු වී තිබුණි. | අධික ගමන්බලපත්‍ර ඉල්ලුම හේතුවෙන් එවකට පැවති තොග දින කිහිපයකට පමණක් ප්‍රමාණවත් වූ බැවින් සැලසුම් කරන ලද පරිදි තොග ලැබෙන තුරු අවශ්‍ය වන ගමන්බලපත් ප්‍රමාණය ගුවන් මගින් ගෙන්වා ගැනීමට සිදුවී ඇති බව දක්වා තිබුණි. | හිස් ගමන්බලපත්‍ර අවශ්‍යතාවය නිවැරදිව මිලදී ගැනීම් කර හඳුනාගෙන ගබඩාකර අවශ්‍යතාවයට සරිලන පරිදි නිකුත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| ඌ) | ද්විත්ව පුරවැසිභාවය ලබාගැනීම සඳහා වන අයදුම්පත්, ලියාපදිංචි කිරීමෙන් පසු මාණ්ඩලික නිලධාරියෙකු විසින් පරීක්ෂාකර පද්ධතියට දත්ත ඇතුළත් කිරීම සඳහා මාස 10 සිට මාස 14 ක කාලයක් ගත වී තිබුණු අතර, එම අයදුම්පත්වල හඳුනාගත් අඩුපාඩු අයදුම්කරු වෙත | ගොනුව ලියාපදිංචි කිරීමෙන් අනතුරුව බුද්ධි අංශ වාර්තා කැඳවීම සඳහා අයදුම්පත්‍රය ජාතික බුද්ධි අංශය වෙත යොමු කිරීමෙන් පසු ගොනුව අනුමැතිය සඳහා මාණ්ඩලික නිලධාරියා [නියෝජ්‍ය පාලක(I)] වෙත යොමු කරයි. ඉන් පසුව අඩුපාඩු නොමැති අයදුම්පත් | ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා වන අයදුම්පත් ලියාපදිංචිකර අදාළ නිලධාරින් විසින් පරීක්ෂාකර පද්ධතියට දත්ත ඇතුළත් කිරීමට කඩිනමින් ක්‍රියා කළ යුතු අතර, හඳුනාගත් අඩුපාඩු |

| | | | |
|---|---|---|---|
| | විද්‍යුත් පණිවුඩ මඟින් යැවීමට ද කටයුතු කර නොතිබුණි. | දත්ත පද්ධතිය වෙත ඇතුළත් කිරීම සිදු කරන බවත් එක් මාසයක් සඳහා අයදුම්පත් දහසකට ආසන්න ප්‍රමාණයක් ලැබෙන බවත්, ඒ සඳහා අනුයුක්ත නිලධාරින් පුරවැසි අංශයේ රාජකාරිවලට අමතරව ගමන් බලපත්‍ර අංශයේ රාජකාරි වලට යොමුවීම මත ද්විත්ව පුරවැසි ගොනු පරීක්ෂාවට යම් කාලයක් ගතවන බවත් සඳහන්කර තිබුණි. | අයදුම්කරුවන් වෙත විද්‍යුත් පණිවිඩ මඟින් යැවීමට ක්‍රියකළ යුතු වේ. |
| එ) | 2023 වර්ෂය තුළදී ද්විත්ව පුරවැසිභාවය ලබාගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් අතරින්, විගණිත දින වන විට පරිගණක පද්ධතිය තුළ ලියාපදිංචිය පමණක් සිදුකර මාස 03 සිට 05 ක කාලයක් ගත වී තිබූ අවස්ථා නිරීක්ෂණය විය. | අයදුම්පත ලියාපදිංචි කිරීමෙන් පසු සපුරාලිය යුතු අවශ්‍යතා සම්පූර්ණ කරගැනීම දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බාහිර කරුණු සඳහා දීර්ඝ කාලයක් ගත වන අවස්ථා ඇති අතර, එම අවශ්‍යතා සම්පූර්ණ නොකර ඉදිරි කටයුතු කළ නොහැකි වීම මෙයට හේතුව බවත් සඳහන් කර තිබුණි. | ලියාපදිංචිකර ඇති අයදුම්පත්වල අඩුපාඩු විද්‍යුත් පණිවිඩ (e- mail) මඟින් දැනුවත්කර කඩිනමින් සම්පූර්ණකර සහතික නිකුත් කිරීමට කටයුතු කළ යුතු ය. |
| ඒ) | ද්විත්ව පුරවැසිභාවය පිරිනැමීමට අදාළ සහතිකපත් අයදුම්කරු වෙත නිකුත්කර විගණිත දින වන විට මාස 04 සිට මාස 10 ක කාලයක් ගත වී තිබුණ ද, අදාළ සියලු ලිපි ලේඛන පරිගණක පද්ධතිය තුළට පරිලෝකනය (scan) කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය. | අදාළ ගොනු පරිලෝකන කටයුතු සිදුකිරීම සඳහා නිලධාරීන් දෙදෙනෙකු රාජකාරියේ යොදවා ඇති අතර, මේ වන විට විශාල වශයෙන් ද්විත්ව පුරවැසි ගොනුවල කටයුතු අවසන් වෙමින් පවතින අතර, රජයේ නිවාඩු දිනවල අංශයේ නිලධාරීන් කිහිප දෙනෙකු යොදවා ඉදිරියේදී මෙම ප්‍රමාදය අවසන් කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි. | ද්විත්ව පුරවැසිභාවය පිරිනැමීමට අදාළ ලිපි ලේඛන පරිගණක පද්ධතිය තුළට පරිලෝකනය (Scan) කිරීමට කඩිනමින් ක්‍රියා කළ යුතු ය. |
| ඔ) | 2023 ඔක්තෝම්බර් 31 දිනට ද්විත්ව පුරවැසිභාවය නිර්දේශ කිරීමේ කමිටුව මඟින් අනුමත කර මුදල් ගෙවීම සඳහා අයදුම්කරුවන් දැනුවත් කළ අයදුම්පත් 6167 ක් පැවති අතර, පළමු අවස්ථාවේදී යවන ලද ඊ -මේල් පණිවිඩය හැර වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් මේ සම්බන්ධයෙන් ගෙන නොතිබුණි. | පුරවැසි අංශය මඟින් මුදල් ගෙවීම සඳහා දැනුම් දීමෙන් අනතුරුව යම් සාධාරණ කාලයක් (මාස 3 ක් පමණ) කාලයක් ඇතුළත මුදල් ගෙවන අවස්ථා බහුලව ඇති බවත්, මුදල් නොගෙවූ අයදුම්පත් එකින් එක තෝරා මුදල් ගෙවන ලෙස යොමු කිරීම ඉතා අපහසු කටයුත්තක් බැවින් 2024 වර්ෂයේ සිට කාර්තුවකට එක් වරක් බැගින් | මුදල් ගෙවිය යුතු කාල සීමාවක් තීරණයකර එය අයදුම්කරුවන් දැනුවත්කර, අයදුම්කරුවන්ට අදාළ සහතික නිකුත් කිරීමෙන් පසු අනුමත ආදායම් එකතු කරගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | සිහිකැඳවීම් ඊමේල් තොරතුරු තාක්ෂණ අංශය හරහා දන්වා යැවීමට කටයුතු කරමින් පවතින බවත් දක්වා තිබුණි. | |
| ඔ) | හඳුනාගත් අඩුපාඩු පිළිබඳව විද්‍යුත් තැපැල මඟින් අයදුම්කරු දැනුවත් කරනු ලැබුව ද ඒ සඳහා ප්‍රතිචාරයක් නොතිබුණු අවස්ථාවන්හිදී ඒ සම්බන්ධයෙන් පසුවිපරම් කර තිබූ බවට අදාළ ලිපිගොනු අනුව තහවුරු කරගත නොහැකි විය. | අඩුපාඩු දක්වා යවා මාස 2 ක් ගතවූ පසු දෙවනවර දන්වා යැවීමටත් ඒ සම්බන්ධයෙන් මසක් ඇතුළත පිළිතුරු නොලදහොත් අදාළ තානාපති කාර්යාලය වෙත දන්වා යැවීමටත් කටයුතු කරන බව දක්වා තිබුණි. | අයදුම්පත්වල අඩුපාඩු අයදුම්කරුවන්ට නිවැරදි ආකාරයට සන්නිවේදනය වී තිබේ ද යන්න පිළිබඳව පසුවිපරම් කටයුතු සිදු කළ යුතු වේ. |
| ක) | නිර්දේශ කිරීමේ කමිටුව වෙත ඉදිරිපත්කර තිබූ ද්විත්ව පුරවැසිභාවය සඳහා වන අයදුම්පත් කමිටුව විසින් අනුමත කිරීම සඳහා මාස 03 සිට 06 ක කාලයක් ගත වූ අවස්ථා පැවතුණි. | ද්විත්ව පුරවැසි අයදුම්පත් නිර්දේශ කිරීමේ කමිටුව මඟින් මේ වන විට අයදුම්පත් විශාල ප්‍රමාණයක් සඳහා නිර්දේශ ලබාදී ඇති බවත්, පෙර තිබූ ප්‍රමාදයක් වළක්වාගෙන කඩිනමින් නිර්දේශ ලබාදීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බවත් දක්වා තිබුණි. | නිර්දේශ කිරීමේ කමිටුව වෙත ඉදිරිපත්කර ඇති ද්විත්ව පුරවැසිභාවය සඳහා වන අයදුම්පත් කමිටුව විසින් ප්‍රමාදයකින් තොරව අනුමත කළ යුතු වේ. |
| (ග) | තොරතුරු තාක්ෂණ අංශය මඟින් විගණනය වෙත ලබාදුන් වාර්තාව අනුව 2023 වර්ෂය තුළදී ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය සහ ශාඛා කාර්යාල වෙත සාමාන්‍ය සේවය යටතේ විදේශ ගමන්බලපත්‍ර අයදුම්පත් 321,216 ක් ලැබී තිබූ අතර, වර්ෂය තුළදී ඉන් ගමන් බලපත්‍ර 198,592 ක් එනම් සියයට 62 ක් පමණක් නිකුත් කර තිබුණි. | අයදුම්පත් පරිගණකගත කිරීමේදී හඳුනාගනු ලබන ගැටලු නිරවුල්කර ගනිමින් ඉතිරි අයදුම් සඳහා වන ගමන් බලපත්‍ර මුද්‍රණය කර අයදුම්පත්කරුවන් වෙත කඩිනමින් ලබාදීමට කටයුතු කරන බව දක්වා තිබුණි. | ලැබී ඇති විදේශ ගමන් බලපත්‍ර අයදුම්පත් සඳහා ගමන් බලපත්‍ර නිකුත් කිරීමට කඩිනමින් ක්‍රියාකළ යුතු ය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය 1,318 ක් ද, තථ්‍ය කාර්යය මණ්ඩලය 1,106 ක් ද වූ අතර, සේවක මණ්ඩල පුරප්පාඩු 212 ක් පැවතුණි. | වර්තමානයේ පුරප්පාඩු 214 ක සංඛ්‍යාවක් ඇති බවත්, එම පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන අදාළ කටයුතු සිදු කරමින් පවතින බවත් දක්වා තිබුණි. | පවතින පුරප්පාඩු පිරවීමට පියවරගත යුතු ය. |